ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**ශ්‍රී ලංකාවේ කිරි ගොවීන් සඳහා ඉන්දියාවේ දී ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක්**

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය කරමින් කිරි ගොවීන් 25 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් 2025 දෙසැම්බර් 14-20 දක්වා ඉන්දියාවේ පැවති විශේෂ පුහුණු සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් සඳහා සහභාගී විය. ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2025 අප්‍රේල් මස ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකස් කරන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ.

2. ඉන්දීය රජය විසින් මෙම වැඩසටහන ගුජරාටයේ, ආනන්ද් හි ජාතික කිරි සංවර්ධන මණ්ඩලයේ දී සතියක් පුරා පවත්වන ලදී. මෙම වැඩසටහනට කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමස්ත අගය දාමය ආවරණය කරමින් තාක්ෂණික සහ විවිධ තේමා යටතේ සවිස්තරාත්මක සැසි ඇතුළත් විය. ප්‍රධාන වශයෙන්ම සත්ව අභිජනන ක්ෂේත්‍රයේ තාක්ෂණික වර්ධනයන්, කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමස්ත අගය දාමය තුළ ගුණාත්මකභාවය සහතික කිරීම, විවිධ සත්ව කාණ්ඩ සඳහා ආහාර ලබා දීමේ ක්‍රමවේද සහ සමබර පෝෂණයේ වැදගත්කම යනාදිය පිළිබඳ සැසි වැඩසටහනට ඇතුළත් වූ අතර ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම, කර්මාන්තය පිළිබඳ දැනුම ශක්තිමත් කිරීම සහ නිෂ්පාදන ශක්‍යතාවයන් වර්ධනය කිරීම යනාදියට විශේෂ අවධානයක් යොමු කරන ලදී.

3. අත්දැකීම් ඇසුරෙන් ඉගෙන ගැනීමට අවස්ථාව සලසා දෙමින් ප්‍රධාන පෙළේ ආයතන සහ කර්මාන්තශාලා වෙත චාරිකා ද වැඩසටහනට ඇතුළත් විය. මෙම නියැලීම් තුළින් වර්තමාන කිරි ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය, නවීන නිෂ්පාදන තාක්ෂණයන් සහ වෙනස් වන සිල්ලර වෙළෙඳපොළ සහ සැපයුම් දාම පිළිවෙත් සම්බන්ධයෙන් වටිනා දැනුම් සම්භාරයක් ලබා ගැනීමට හැකි විය.

4. තාක්ෂණික කුසලතා වර්ධනයට අමතරව වැඩසටහන තුළින් ශ්‍රී ලංකාවේ කිරි ගොවීන්ට ගොවි ජීවනෝපායන් වැඩි දියුණු කිරීම සහ තිරසාර කිරි ආශ්‍රිත පද්ධතීන් ගොඩනැගීම කේන්ද්‍ර කර ගත් ඉන්දියාවේ සාර්ථක කිරි නිෂ්පාදන ආකෘතිය පිළිබඳව දැනුම සහ අත්දැකීම් ද ලබා දෙන ලදී. මෙම පුහුණු වැඩසටහන කාර්යක්ෂම ලෙස කිරි

ගොවිපළ කළමනාකරණය කිරීම, පිරිසිදුව කිරි නිෂ්පාදනය කිරීම, නිසි සනීපාරක්ෂක ක්‍රම භාවිතා කිරීම සහ දේශගුණ ප්‍රත්‍යාස්ථිත සහ පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවේශයන් සම්බන්ධයෙන් කණ්ඩායමේ දැනුම සහ හැකියාවන් ශක්තිමත් කිරීමට ඉවහල් විය.

***

**කොළඹ**
***2025* දෙසැම්බර් *26***